# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2269/12 - 2022 මාර්තු මස 01 වැනි අඟහරුවාදා - 2022.03.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 66ඇ වගන්තිය සමඟ කියවිය යුතු 66උ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

සබරගමුව පළාතේ පළාත් පාලන කොමසාරිස් දුලිප් සොමිරත්න වන මම, 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත 262 අධිකාරය වන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66ඇ වගන්තිය සමඟ කියවිය යුතු 66 උ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සබරගමුව පළාත තුළ පිහිටියාවූ මාවනැල්ල ප්‍රාදේශීය සභාවෙහි පුරප්පාඩු වී ඇති සභාපති ධූරය සඳහා අලුත් සභාපතිවරයෙකු තෝරා පත්කර ගැනීමේ කාර්යය සඳහා වන රැස්වීම, 2022ක් වූ මාර්තු මස 04 වැනි දින පෙ.ව. 10.00ට මාවනැල්ල ප්‍රාදේශීය සභාව, මාවනැල්ල ලිපිනයෙහි පිහිටි, මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ රැස්වීම් ශාලාව යන ස්ථානයේ දී කැඳවනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

**දුලිප් සොමිරත්න,**
පළාත් පාලන කොමසාරිස්,
සබරගමුව පළාත.

EOG 02 - 0694


1A -PG 005764 — 15 (2022/02)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*